# සමෘද්ධි මහා සංගමය



ඩබ්. පී. මිත්‍රරත්න

අධ්‍යක්ෂ ජනරාල්

## මෙම පොත් පිංච ගැන

සමෘද්ධි බැංකු සංගම් ව්‍යාපාරය දුප්පතුන් බල ගැන්වීම සඳහා ලංකාව පුරා වේගයෙන් ව්‍යාප්ත වෙමින් පවතී. මේ වනවිට දිස්ත්‍රික්ක 18 ක් තුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 104 ක් හි සමෘද්ධි බැංකු සංගම් 475 ක් ගනුදෙනු ආරම්භ කර ඇත. මෙම වර්ෂය අවසාන වනවිට බැංකු සංගම් 1000 කට ආසන්න ප්‍රමාණයක් ස්ථාපනය කිරීම සඳහා පුහුණු කටයුතු හා ආයතනික සංවර්ධන කටයුතු කරමින් සිටී. දුප්පත් පවුල් ලක්ෂ 12 කට ආසන්න ප්‍රමාණයක් මෙම නව සංවිධාන ජාලය තුල සාමාජිකත්වය ගනී යැයි උපකල්පනය කර ඇත. මෙම වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් හෝ මැතිවරණ කොට්ඨාශයක් තුල පවත්නා සියළුම සමෘද්ධි බැංකු සංගම් එක්කරමින් සමෘද්ධි මහ සංගම් පිහිටුවීම ආරම්භ කර ඇත. විවෘත ආර්ථිකය තුල දුප්පතුන්ගේ මහා සංවිධාන ගොඩ නැගීමේ අවශ්‍යතාවත්, එම මහ සංවිධානවල කාර්යභාරයත් මැනවින් අවබෝධ කරගැනීම ප්‍රයෝජනවත්ය. සමෘද්ධි බැංකු සංගම් ව්‍යාපාරය ජනතා ව්‍යාපාරයක් ලෙස අත්දැකීම් ලබාගනිමින් වර්ධනය වන්නකි. එහෙයින් සමෘද්ධි මහ සංගම්වල කාර්යභාරයද එන්න එන්නම ගැඹුරුවේ. කෙසේ වෙතත් මෙම පොත් පිංච තුලින් මෙම ව්‍යාපාරයට සම්බන්ධ වෙන පිරිස්වලට සමෘද්ධි මහ සංගම් පිළිබඳව මූලික අවබෝධයක් ලබාගැනීමට හැකිවේ යැයි සිතමි.

ඩබ්.ජී. මිත්‍රරත්න,
අධ්‍යක්ෂ ජනරාල්.

# ඇතුල් පිටු


| | | පිටු අංක |
|---|---|---|
| 1. | පද්ධති සංකල්පය හා සමෘද්ධි බැංකු සංගම් ව්‍යාපාරය | 1 - 2 |
| 2. | සාමාජිකත්ව සහභාගිත්වය හා ප්‍රජාතන්ත්‍රවාදී පාලනය | 3 |
| 3. | විධායක කමිටුව | 4 |
| 4. | සමෘද්ධි මහ සංගමයේ කාර්යභාරය | |
| | 1. කළමනාකරණ කටයුතු | 5 - 8 |
| | 2. මානව සම්පත් සංවර්ධනය | 8 - 10 |
| | 3. ණය අරමුදල් සම්පාදනය | 11 - 12 |
| | 4. බැංකු සංගම් සංරක්ෂණය | 12 - 16 |
| | 5. බාහිර ආයෝජනය කටයුතු | 17 |
| | 6. බහුවිධ සංවර්ධන ප්‍රවේශය | 17 - 20 |
| 5. | සමාප්තිය | 20 |
| | උප ලේඛණ | |
| | I මහ සංගමයේ කාර්යභාරය දැක්වෙන සටහන | 21 |
| | II මහ සංගමයේ සංවිධාන ව්‍යුහය | |
| | III කාර්ය මණ්ඩල රාජකාරි ලැයිස්තුව | |

# සමෘද්ධි මහ සංගමය

## පද්ධති සංකල්පය හා සමෘද්ධි බැංකු සංගම් ව්‍යාපාරය

සමෘද්ධි වැඩසටහන තුල දිළිඳුකම පිටුදැකීමේදී දුප්පතුන් බලශක්තිකරණය කිරීම සඳහා විශේෂයෙන් ක්‍රියාත්මක වන්නේ සමෘද්ධි බැංකු සංගම් ව්‍යාපාරයයි. මෙම බැංකු සංගම් ව්‍යාපාරය එක්තරා පද්ධතියක ස්වරූපයක් ගනී. පද්ධතියක ලක්ෂණ වන්නේ එහි උප පද්ධතීන් කිහිපයක් තිබීමත්, එම එක් එක් උප පද්ධතිය එයට ආවේනික ක්‍රියාවලියක නිරතවීම හා එම ක්‍රියාකාරකම් සමස්ථ පද්ධතියට බලපෑම් කිරීමත්ය. උදාහරණයක් ලෙස මිනිස් සිරුර පද්ධතියක් ලෙස සැලකීමට පුලුවන. එහි රුධිර සංසරණ උප පද්ධතිය, පීරණ උප පද්ධතිය, ස්නායු උප පද්ධතිය, ස්වසන උප පද්ධතිය, අස්ථි උප පද්ධතිය ආදී වශයෙන් උප පද්ධති ගණනාවක් දක්නට ලැබේ. මෙම එක් එක් උප පද්ධතියට ආවේනික ක්‍රියාවලියක් ඇත. උදාහරණයක් ලෙස රුධිර වාහිනී උප පද්ධතිය මඟින් මුළු ශරීරයේම සෛලවලට අවශ්‍ය ඔක්සිජන් සම්පාදනය හා සෛලවල පවත්නා කාබන් ඩයොක්සයිඩ් වැනි අනවශ්‍ය ද්‍රව්‍ය හෘදය වස්තුවට ගෙන ඒමත් කරනු ලැබේ.




මෙම ක්‍රියාවලිය දුර්වලවීම හෝ ඇනහිටීම මුළු ශරීරයේ අනෙකුත් උප පද්ධතීන්වලට බලපානු ලැබේ. එයට හේතුව මනුෂ්‍ය ශරීරය ඉහත කී උප පද්ධතීන් ගණනාවක ඒකාබද්ධතාවයෙන් ගොඩනැගී තිබීමයි. මේ අන්දමටම සමෘද්ධි බැංකු සංගම් ව්‍යාපාරය තුල උප පද්ධතීන් 4 ක් හඳුනා ගැනීමට පුලුවන. 5 දෙනාගේ කණ්ඩායම එක් උප පද්ධතියකි. කුඩා ගම්මාන මට්ටමේ සමෘද්ධි සමිතිය තවත් උප පද්ධතියකි. කලාප මට්ටමේ බැංකු සංගමය තවත් උප පද්ධතියක් වේ. සමෘද්ධි මහ සංගමයද මෙහි උප පද්ධතියකි.

මෙම එක් එක් උප පද්ධතියට එයට ආවේනික වු ක්‍රියාවලියක් ඇත. උදාහරණයක් වශයෙන් 5 දෙනාගේ කුඩා කණ්ඩායම තුල සතිපතා රැස්වීම් පැවැත්වීම, දැනුම හා අත්දැකීම් හුවමාරුව, කණ්ඩායම් අරමුදලක් ගොඩනැගීම, අතමාරු ණය ගැනීම, ශ්‍රම හුවමාරු වැඩකිරීම, පාරිභෝගික භාණ්ඩ තොග වශයෙන් මිලදී ගෙන සාමාජිකයන් අතර බෙදා ගැනීම, බැංකු සංගමයට ණය නිර්දේශ කිරීම ආදිය දැක්විය හැක. මෙම ක්‍රියාවලිය මඟින් දිළිඳු පවුල් 5 ක සංතිවේදන හැකියා වර්ධනය, අධ්‍යාපනයක් ලැබීම හා සැලසුම් ක්‍රියාවලියක් වෙත යොමුවීම වැනි අරමුණු ඉටුකර ගනු ලැබේ. එමෙන්ම ගම්මාන මට්ටමේ සමෘද්ධි සමිතිය තුලත් එයටම ආවේනික වු ක්‍රියාකාරකම් ඇත. සති දෙකකට වරක් රැස්වීම, කණ්ඩායම් අත්දැකීම් ඉදිරිපත් කිරීම හා කණ්ඩායම් ප්‍රගතිය සොයා බැලීම, බැංකු සංගමයට ඉදිරිපත් කරන ණය ඉල්ලුම් පත්‍ර විවෘතව සාකච්ඡා කර අනුමත කිරීම, සාමාජිකයින්ගේ කුශලතා වර්ධනය,, සහාය සේවා පද්ධතියේ සේවාවන් ලබාකර ගැනීම ආදිය මෙම සමිතිය නැමැති උප පද්ධතියේ ක්‍රියාකාරකම් වේ. බැංකු සංගමය නැමැති උප පද්ධතිය තුල විශේෂයෙන් සාමාජිකයින්ගේ ඉතුරුම් ප්‍රවර්ධනය හා ණය ලබාදීම සිදුවේ. මෙම උප පද්ධති අතර සමෘද්ධි මහ සංගමය ඉහලින්ම තිබෙන උප පද්ධතියවේ. එයටද එයටම ආවේනික කාර්යයන් ඇත.

ඉහත කී උප පද්ධති එකක් අනිත් උප පද්ධතියට බලපෑම් ඇති කරන අතර සමස්ථ පද්ධතියේ ක්‍රියාකාරිත්වයේ සාර්ථකත්වයට හෝ අසාර්ථකත්වය එම බලපෑම් හේතුවේ. උදාහරණයක් ලෙස 5 දෙනාගේ කුඩා කණ්ඩයම හරියාකාරව ණය නිර්දේශ කිරීම නොකරන්නේ නම් එය බැංකු සංගමයේ ණය ආපසු අයකර ගැනීම කෙරෙහි අහිතකර බලපෑම් ඇති කරනු ලැබේ. එමෙන්ම මහ සංගමය බැංකු සංගමයේ කටයුතු නිසි පරිදි අධීක්ෂණය නොකරන්නේ නම් සමහරවිට බැංකු සංගමයේ විවිධ මුල්‍ය හා පරිපාලන අක්‍රමිකතා ඇතිවීමට පුලුවන. එසේවීම සමස්ථ බැංකු සංගම් ක්‍රියාවලියටත්, දුප්පතුන් බලගැන්වීමේ ක්‍රියාවලියටත් බලපෑම් ඇති කරනු ලැබේ. මේ අනුව අපට පැහැදිලි වනුයේ සමෘද්ධි බැංකු සංගම් ව්‍යාපාරය තුල පවත්නා උප පද්ධතින්ගේ ක්‍රියාකාරකම් සමස්ථ පද්ධතිය වෙත බලපෑම් ඇතිකරන බවයි.

මෙහිදී විශේෂයෙන් සලකා බලනුයේ සමෘද්ධි මහ සංගම් උප පද්ධතිය පිළිබඳවය. සමෘද්ධි මහ සංගමයක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් හෝ ඊට වඩා කොට්ඨාශ ගණනාවක් වෙනුවෙන් ස්ථාපනය වෙමින් පවති. හැකිතාක් දුරට මැතිවරණ කොට්ඨාශයක් ආවරණය වන පරිදි සමෘද්ධි මහ සංගම් ස්ථාපනය කිරීමට උත්සාහ ගනු ලැබේ. එවිට දේශපාලනමය නායකත්වය සමඟ ද සම්බන්ධතා පැවැත්වීමේ පහසුවක් ඇත. කෙසේ

වෙතත් මෙහිදී භූගෝලීය සාධක මෙන්ම සාමාජිකත්වයේ විශාලත්වය ගැනද අවධානය යොමු කරනු ලැබේ. බැංකු සංගම් දෙක තුනක් වෙනුවෙන් මහ සංගමයක් ඇති කිරීම ආර්ථික වශයෙන් දිගු කාලීනව අවසිදායකවේ. ඊට හේතුව මහ සංගමයට ස්ථිර කාර්ය මණ්ඩලයක් නඩත්තු කිරීම හා නව තාක්ෂණය ලබා කිරීමට වියදම් දැරීමට සිදුවීමයි. එම වියදම් මහ සංගමයට උපයා ගැනීමට නම් බැංකු සංගම් සංඛ්‍යාව වැඩිවිය යුතුය. එමනිසා හැකිතාක් බැංකු සංගම් වැඩි සංඛ්‍යාවක් ඇතුලත් වෙන ලෙස මහ සංගම් ස්ථාපනය කිරීම ආර්ථික ස්වාධීනත්වය කෙරෙහි බලපානු ලැබේ. මේ නිසා බැංකු සංගම් දෙක, තුන ආදී වශයෙන් තිබෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආසන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සමෘද්ධි බැංකු සංගම් සමඟ එක්වී මහ සංගම් ස්ථාපනය කිරීම වඩාත් යෝග්‍යවේ. නමුත් මුලදී සමහර සමෘද්ධි මහ සංගම් බැංකු සංගම් අඩු සංඛ්‍යාවකින් ස්ථාපනය වෙන අවස්ථා ඇත. එහෙත් මේවායේ කාලයත් සමඟ ආර්ථික ශක්තිය මැන බලා අනාගතයේදී ඒකාබද්ධ කිරීමක් කිරීමට සිදුවීමට ඉඩ තිබේ.

## සාමාජිකත්ව සහභාගිත්වය හා ප්‍රජාතන්ත්‍රවාදී පාලනය




සමෘද්ධි මහ සංගමය එම ව්‍යාපාරයේ උප පද්ධතීන් අතර ඉහළින්ම තිබෙන උප පද්ධතිය ලෙස හැඳින්වීමට පුලුවන. මුළු බැංකු සංගම් ව්‍යාපාරය වෙනුවෙන්ම ප්‍රතිපත්තිමය තීරණ ගන්නා ඉහළම මණ්ඩලය වන්නේ 21 දෙනෙකුගෙන් සමන්විත සමෘද්ධි මහ සංගමයේ විධායක කමිටුවයි. මෙම කමිටුව සම්පූර්ණයෙන්ම මහ සංගම් සාමාජිකත්වය මඟින් ප්‍රජාතන්ත්‍රවාදී අන්දමට වාර්ෂික සම්මේලනයකදී තෝරාගනු ලැබේ. විධායක කමිටුවට කිසිම සාමාජිකයෙක් බාහිර නම් කිරීමක් යටතේ පත්වන්නේ නැත. වාර්ෂික සම්මේලනයට බල ප්‍රදේශ තුල කුඩා ගම්මාන මට්ටමේ සමෘද්ධි සමිතිවල සභාපතිවරුන් සහභාගිවේ.

සමෘද්ධි සමිති, මහ සංගමයේ සාමාජිකත්වය වාර්ෂිකව රු. 25/- ක් ගෙවා ගත යුතුව ඇත. මෙම සාමාජිකත්වය තුලින් වාර්ෂික සම්මේලනයේදී විධායක කමිටුව තේරේ. තවද මෙම විධායක කමිටු සාමාජිකයින් 21 දෙනා අතරින් සභාපති, උප සභාපති, ලේකම්, උප

ලේකම් හා භාණ්ඩාගාරික යන අයද තෝරාගනු ලබන්නේ මහ සංගමයේ සම්මේලනයේ සාමාජික කැමැත්ත මතය. තවත් විශේෂයක් වන්නේ සමෘද්ධි මහ සංගම් ව්‍යවස්ථාවේ 8 : 05 වගන්තිය අනුව ඉහත සඳහන් තනතුරු 5 සඳහා පත්විය හැක්කේ එක් වාර්ෂයක කාලයක් සඳහා පමණි. ඊළඟ වාර්ෂික සම්මේලනයේදී එම තනතුරටම නැවත පත්වීමට ව්‍යවස්ථාව අනුව නොහැක. උදාහරණයක් ලෙස මහ සංගමයේ සභාපති තනතුරට එක් වර්ෂයක් පත්වූ පසු එම තනතුරටම නැවත වර්ෂ තුනක් යන තෙක් පත්වීමට නොහැක. නමුත් වෙනත් තනතුරකට පත්වීමට ව්‍යවස්ථාවෙන් බාධාවක් නැත. මෙහිදී කර ඇත්තේ නිතර නිතර අළුත් නායකයින්ට මහ සංගමයේ තනතුරුවලට පත්වීමට ඉඩ සැලසීමට හා එකම නායකයෙක් සිටීම නිසා විවිධ අනුගාමික කණ්ඩායම් ඇතිවීම වැලැක්වීම සඳහාය. මේ අනුව සමෘද්ධි මහ සංගමය තුල ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ඇති කිරීමටත්, නව නායකයින්ට වැඩිපුර අවස්ථාව සැලසීමටත් ව්‍යවස්ථාව තුලින්ම විධිවිධාන යොදා ඇත.

## විධායක කමිටුව

මහ සංගමයේ වාර්ෂික සම්මේලනය මඟින් සමෘද්ධි බැංකු සංගම් ව්‍යාපාරයේ ප්‍රතිපත්ති හා අරමුණු ඉටු කිරීම සඳහා 21 දෙනෙකුගෙන් සමන්විත විධායක කමිටුවක් තෝරාගනු ලැබේ. මහ සංගමයේ ගමන් මාර්ගය පැහැදිලි කිරීම සඳහා ප්‍රධාන ප්‍රතිපත්ති 5 ක් ව්‍යවස්ථාවේ 5 වන වගන්තියේ දැක්වේ.

1. මානව ගරුත්වය හා සමාජ සාධාරණත්වය.
2. දුප්පත් පවුල්වල ස්වශක්තිය හා සමුහ ශක්තිය කෙරෙහි තබන අචල විශ්වාසය.
3. කාන්තා සහභාගිත්වයට ප්‍රමුඛතාවදීම.
4. විවෘතභාවය.
5. බහුවිධ සංවර්ධන ප්‍රවේශය.

විධායක කමිටුවට පැවරෙන වගකීම් හා බලතල මහ සංගම් ව්‍යවස්ථාවේ 9 වන වගන්තිය උප වගන්ති 26 කින් පැහැදිලි කර ඇත. තවද විධායක කමිටුවට පැවරී ඇති වගකීම්

ඉටු කිරීම සඳහා වෙනම කාර්යාලයක් පවත්වාගෙන යාමට ව්‍යවස්ථාවෙන් බලයදී ඇත. තවද විධායක කමිටුව අවම වශයෙන් මසකට එක් දිනක්වත් රැස්විය යුතු බව ව්‍යවස්ථාවේ 9.03 වගන්තියේ සඳහන්ව ඇත. මේ අනුව විධායක කමිටුව මගින් මාසිකව රැස්වී තම බලප්‍රදේශයේ සමෘද්ධි බැංකු සංගම් වැඩසටහන පිළිබඳව ප්‍රගතිය සමාලෝචනය කරමින් තීරණ ගනු ලැබිය යුතුව ඇත. මහ සංගම් කාර්යාලයේ කළමණාකාර අධ්‍යක්ෂවරයා (දැනට මූලස්ථාන කළමණාකරු) විසින් විධායක කමිටුව වෙත අවශ්‍ය තොරතුරු සපයමින් තීරණ ගැනීම්වලට සහායවිය යුතුව ඇත.

සභාපතිවරයා මහ සංගමයේ කටයුතු සමඟ ලඟින් සම්බන්ධවී සිටිය යුතුව ඇත. මහ සංගමයේ කාර්ය භාරය අනාගතයේදී වැඩිවීමත් සමඟ සභාපතිවරයාට එදිනෙදා තීරණ ගැනීම්වලට සම්බන්ධවීමට මහ සංගම් කාර්යාලයේ රැඳී සිටීමට සිදුවෙන අවස්ථා වැඩිවේ. එසේම විවිධ සම්බන්ධීකරණ කටයුතුවලට සහභාගිවීමටත්, බැංකු සංගම් මහ සභා රැස්වීම්වලට සහභාගිවීමටත් සිදුවේ. එවැනි කාලයක් වනවිට පූර්ණ කාලීන සේවාවක් සභාපතිවරයාගෙන් ගැනීමට සිදුවේ. එවිට සභාපතිවරයාට විශේෂ දීමනාවක් ගෙවීමට විධායක කමිටුවට හැක.

විධායක කමිටුව මගින් සාමාජික අවශ්‍යතාවන් හා අයිතිවාසිකම් සුරැකීම ඉතාමත් වැදගත්වේ. එසේ නොවුවහොත් මහ සංගම් කාර්යාලය වඩාත් නිළධාරිවාදී ලක්ෂණ ඉසිලීමට ඉඩ ඇත. එවිට සාමාජිකත්වය ක්‍රම ක්‍රමයෙන් නොසලකා හැරීමක් වීමටද පුලුවන. එමනිසා සාමාජික ව්‍යාපාරයක් ලෙසත්, දිළිඳුකම පිටුදැකීමේ ව්‍යාපාරයක් ලෙසත් මහ සංගමය ක්‍රියාත්මකවීමට විධායක කමිටුවේ ක්‍රියාකාරීත්වය ඉතා වැදගත්ය. එසේම සාමාජිකත්වයේ අයිතින් ආරක්ෂාවන අන්දමට බැංකු සංගම් ව්‍යාපාරය මෙහෙයවීමට හැකිවන්නේ සභාපතිවරයා ඇතුළු විධායක කමිටුවේ මැදිහත්වීම නිසාය. මෙහිදී මහ සංගම් කාර්යාල මණ්ඩලය හා විධායක කමිටුව අතර ගැටුම් ඇති නොවන අන්දමට සුහද සම්බන්ධතාවක් ගොඩ නගා ගැනීමද අවශ්‍යවේ.

# සමෘද්ධි මහ සංගමයේ කාර්යභාරය

සමෘද්ධි මහ සංගමයේ කාර්යාලය මඟින් විධායක කමිටුව විසින් ගන්නා ලබන තීරණ ක්‍රියාත්මක කරනු ලැබේ. සමෘද්ධි මහ සංගම්වල අරමුණු ව්‍යවස්ථාවේ 6 වන වගන්තිය විස්තර කර ඇත.



1. අඩු ආදායම්ලාභී පවුල්වල නිෂ්පාදන හා සේවා වර්ධනය කිරීම සඳහා (සමෘද්ධි බැංකු මඟින්) අවශ්‍ය ණය, පාරිභෝගික, ආපදා හා නිවාස ණය හා රක්ෂණ ආවරණය ඇති කරමින් ආර්ථික වර්ධනය.
2. දුප්පතුන් සමාජ සජීවිකරණ ක්‍රියාවලියකට හසුකරමින් අන්තර් පුද්ගල සම්බන්ධතා වර්ධනය කිරීම සඳහා 5 දෙනාගේ කණ්ඩායම් හා සමෘද්ධි සමිති ස්ථාපනය කිරීම.
3. කුඩා කණ්ඩායම්, සමෘද්ධි සමිති, බැංකු සංගම් හා මහ සංගම් ආදී වශයෙන් දුප්පතුන් විවිධ තලවලදී සංවිධානය කිරීම හා ආයතනගත කිරීම.
4. අඩු ආදායම් ලබන්නන්ගේ මන්ද පෝෂණය පිටු දකිමින් කායික, මානසික හා සමාජයීය සෞඛ්‍ය වර්ධනය කිරීම.
5. අඩු ආදායම්ලාභීන්ගේ අධ්‍යාත්මික සංවර්ධනය.
6. අඩු ආදායම්ලාභීන්ගේ දේශපාලනමය ශක්ති වර්ධනය.

මහ සංගමයේ අරමුණු වඩාත් පළල් ක්‍ෂෙත්‍රවලට යොමු කර ඇත්තේ දිළිඳුභාවය ඉතාමත් සංකීර්ණ හා ගැඹුරු හේතූන් රාශියක් හා බැඳී පවතින හෙයින්ය. දුප්පත් පවුල් පූර්ණ සංවර්ධනයක් කරා මෙහෙයවීමේ පරමාර්ථය ඇතිව ඉහත සඳහන් අරමුණු ගොනුකර ඇතිබව ඉතා පැහැදිලිව පෙනේ. මේ අනුව සමෘද්ධි මහ සංගම් කාර්යභාරයද, වඩාත් පළල් හා ගැඹුරු ක්‍ෂේත්‍ර වෙත යොමු වෙන බවද පැහැදිලිවේ.

## 1. කළමනාකරණ කටයුතු

සමෘද්ධි මහ සංගමය මඟින් සමස්ථ වැඩසටහනම කළමනාකරණය කරනු ලැබේ. මෙම කළමනාකරණ ක්‍රියාවලියේදී ප්‍රධාන අංශ 3 ක් විශේෂ වැදගත්කමකින් යුක්තවේ. එම අංශ 3 කෙටියෙන් පහත පැහැදිලි කරනු ලැබේ.

### 1:1 සම්බන්ධීකරණය

සමෘද්ධි මහ සංගමය මඟින් මුළු බැංකු සංගම් වැඩසටහනම සම්බන්ධීකරණය කිරීමේ කටයුතු කරනු ලැබේ. මෙහිදී ප්‍රධාන අංශ කිහිපයක් පිළිබඳව සම්බන්ධීකරණ කටයුතු කිරීමට මහ සංගමයට සිදුවේ.

A - තම බල ප්‍රදේශය තුල පිහිටා ඇති සියළුම සමෘද්ධි බැංකු සංගම් සමඟ.

B - සියළුම සමෘද්ධි සමිති සමඟ.

C - තම ප්‍රදේශයේ ක්‍රියාත්මක වන සහාය සේවා සපයන ආයතන හා සංවිධාන සමඟ.

D - ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය සමඟ.

E - දේශපාලන නායකත්වය සමඟ.

F - දේශීය හා විදේශීය ආධාර දෙන ආයතන සමඟ.




සමෘද්ධි බැංකු සංගම්වල තොරතුරු ලබාගනිමින්, සාකච්ඡා හා ප්‍රගති සමාලෝචන පවත්වමින් සම්බන්ධිකරණ කටයුතු කිරීමට මහ සංගමයට සිදුවේ. එමෙන්ම සමෘද්ධි බැංකු සංගම්වල මහ සභා රැස්වීම් පැවැත්වීමට උපදෙස් දෙමින් හා සහභාගිවෙමින් සම්බන්ධතා ශක්තිමත් කරගත යුතුව ඇත. සමෘද්ධි සමිතිවල ක්‍රියාකාරිත්වය ගැනද මහ සංගමය සැලකිල්ල යොමු කළ යුතුය. විශේෂයෙන්ම ප්‍රදේශයේ පවත්නා විවිධ සහාය සේවා ආයතන සමඟ සම්බන්ධිකරණ කටයුතු කරමින්, එම සේවා ගම්මාන මට්ටමට යැවීමට වැඩ පිළිවෙලවල් සම්පාදනය කිරීමට මහ සංගමයට හැක. උදාහරණයක් ලෙස සෞඛ්‍ය, කෘෂිකර්ම, පොල් මණ්ඩල වැනි ආයතන වලින් සපයන සේවාවන් සමෘද්ධි සමිතිවලට යැවීමට සංවිධාන කටයුතු කළ හැක. ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියද ඉදිරි කාලයේ සම්බන්ධතා පැවැත්වීමට අදහස් කරන්නේ සමෘද්ධි මහ සංගම් සමඟය. සමෘද්ධි බැංකු සංගම් හා සමිති විශාල ප්‍රමාණයක් රටපුරා තිබෙන හෙයින් ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියට ඒවා සමඟ සෘජු සම්බන්ධතා පැවැත්වීම කළ නොහැක. මේ නිසා එම සියළුම සංවිධාන පිළිබඳ තොරතුරු ලබාගැනීම ආදිය කරනු ලබන්නේ සමෘද්ධි මහ සංගම් තුලින්ය. පවත්නා දේශපාලන නායකත්වය සමඟ ද මහ

සංගම් විසින් ඉතාමත් සුහද සම්බන්ධතාවක් පවත්වා ගැනීම අවශ්‍යවේ. තවද දේශීය හා විදේශීය ආධාර දෙන ආයතනවල සහායද මහ සංගමයට ලබාගැනීමට පුලුවන. ඊට හේතුව එම සංවිධානද ප්‍රජා මූල සංවිධානවලට ආධාර ලබාදීමට වැඩි කැමැත්තක් දැක්වීමයි. මේ නිසා මහ සංගමය විසින් තම සේවාවන් පිළිබඳ යථා තත්වය ආධාරදෙන ආයතනවලට දැනගැනීමට සැලැස්වීම ඉතාමත් වැදගත්ය. මේ අනුව මහ සංගමයට සම්බන්ධිකරණය පිළිබඳ විශාල වැඩ කොටසක් පැවරෙන බව පෙනේ.

## 1:2 අධීක්ෂණය

සමෘද්ධි මහ සංගමය තුලින්, විශේෂයෙන්ම සමෘද්ධි බැංකු සංගම් වැඩසටහන අධීක්ෂණයට ලක්කිරීම අත්‍යාවශ්‍යවේ. ඊට හේතුව බැංකු සංගම් මූල්‍ය ආයතන විශේෂයක් වන හෙයින් විශාල සාමාජික මුදල් ප්‍රමාණයක් පරිහරණය කිරීමයි. එහෙයින් එම මුදල්වලට ආරක්ෂාව ලබාදීම මහ සංගමයේ වගකීමක්වේ. මෙසේ අධීක්ෂණය කිරීමට ඇති බලය පිළිබඳව මහ සංගම් ව්‍යවස්ථාවේ 9:18 වගන්තියේ මෙසේ දැක්වේ. "සමෘද්ධි බැංකු සංගම් අධීක්ෂණය කිරීමට හා එම සංගම්වලට උපදෙස් හා නියෝග දීමට විධායක කමිටුවට හැක." එමෙන්ම බැංකු සංගම්වල පවත්නා අඩුපාඩුකම් වඩාත් නිවැරදි කිරීමටද මෙම අධීක්ෂණය ප්‍රයෝජනවත්වේ. විශේෂයෙන්ම බැංකු සංගම් සතිපතා අධීක්ෂණය කිරීම සඳහා වැඩ පිළිවෙලක් මහ සංගමය මඟින් ආරම්භ කළයුතුව ඇත. එසේම කිසියම් අඩුපාඩුවක් හෝ අක්‍රමිකතාවක් ඇත්නම් ඉක්මණින් හඳුනාගෙන ඒවාට පිළියම් යෙදීමට එවිට පුළුවන.

අධීක්ෂණයේම කොටසක් වශයෙන් බැංකු සංගම් විශේෂ විමර්ශනයකට ලක්කිරීමට මහ සංගමය කළ යුතුව ඇත. එමනිසා මහ සංගමය තුල විශේෂ විමර්ශන ඒකකයක් ගොඩනඟා ගැනීමට කටයුතු කළ යුතුය. එවිට එම විමර්ශන වාර්තා ඔස්සේ ඉදිරි කටයුතු කර වඩාත් නිවැරදි තැනකට බැංකු සංගම් ගෙන ඒමට පුලුවන.

අධීක්ෂණයේ තවත් ඉදිරි පියවරක් ලෙස බැංකු සංගම් විගණනය කිරීම දැක්විය හැක. ව්‍යවස්ථා අනුව බැංකු සංගම් හා මහ සංගමයේ ගිණුම් වාර්තාව විගණනය කිරීමට බැඳී ඇත. එහෙයින් මහ සංගමය බැංකු සංගම් අර්ධ වාර්ෂික හා වාර්ෂික විගණනයකට ලක්කිරීම ඉතා ප්‍රයෝජනවත්වේ. අර්ධ වාර්ෂිකව විගණනයක් කිරීම, වාර්ෂික විගණනය ඉතා හොඳින් කිරීමට ඉවහල්වේ. දැනටමත් පළමුවන, දෙවන හා තෙවන වටවල බැංකු සංගම් අර්ධ වාර්ෂික විගණන කටයුතුවලට යොමුකිරීම අරඹා ඇත. මෙය දිගින් දිගටම පවත්වාගෙන යාම මහ සංගමය විසින් කළයුතුව ඇත. මෙහිදී සමෘද්ධි අධිකාරියේ හා යෝධගම ග්‍රාමීය නායකයින් පුහුණු කිරීමේ ආයතනයේ සහාය ලබාදේ. බැංකු සංගම් මහ සභාවලටත්, මහ සංගමයේ වාර්ෂික සම්මේලනයටත් විගණන වාර්තා ඉදිරිපත් කර සාමාජික අනුමැතිය ලබාගැනීම ව්‍යවස්ථානුකූලව කළ යුතු දෙයකි. මෙසේ කිරීමෙන් සංවිධානයේ විවෘතභාවය ප්‍රදර්ශනය වෙන අතර, සාමාජික විශ්වාසය තහවුරු වීමටද එය හේතුවක්වේ.

## 1:3 පාලනය



බැංකු සංගම් හා සමෘද්ධි සමිති පිළිබඳව පාලන බලයක් සමෘද්ධි මහ සංගමයට ලබාදී ඇත. විශේෂයෙන් සමෘද්ධි බැංකු සංගම්වල සාමාජික අරමුදල් විශාල ප්‍රමාණයක් පරිහරණය කරන නිසා ඒවායේ එක්තරා පාලනයක් කිරීම මහ සංගමයේ වගකීමක්වේ. මෙසේ පාලනය කිරීමට ඉහත දැක්වූ අධීක්ෂණය, විමර්ශනය හා විගණන කටයුතු ද ආධාරවේ. මෙහිදී උපදෙස් ලබාදෙමින් පාලන කටයුතු කිරීමට මහ සංගමයට හැක. මීට අමතරව මාසිකව බැංකු සංගම් සමඟ කරනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම් වලින් ලබාගන්නා තොරතුරු පදනම් කරගෙන ද උපදෙස්දීමට පුළුවන. උදාහරණයක් ලෙස බැංකු සංගම්වල ණය අයවීමේ ප්‍රතිශතය අනුව දුර්වලතාවන් ඇත්නම් හෝ සාමාජික

අරමුදල් බැංකු සංගමයට වාසිවන අන්දමට ආයෝජනය කර නොමැති නම් වහාම ඒ පිළිබඳ අවශ්‍ය උපදෙස් ලබාදීමට මහ සංගමයට පුලුවන.

බැංකු සංගම්වලට උපදෙස්දීමට අමතරව ඒවාට සෘජුව විධාන කිරීමට ද මහ සංගමයට බලය ඇත. මහ සංගම් ව්‍යවස්ථාවේ 9:19 හා 9:20 වන වගන්තිවල මෙම බලය ගැන සඳහන්ව තිබේ. තවද කිසියම් සමෘද්ධි බැංකු සංගමයක පාලක මණ්ඩලය අකාර්යක්‍ෂම නම් හෝ දූෂණ ක්‍රියා තිබේනම් එම පාලක මණ්ඩලය විසුරුවා හැර 5 දෙනෙකුගෙන් සමන්විත තාවකාලික පාලක මණ්ඩලයක් පත්කිරීමටද විධායක කමිටුවට බලය ඇත. මෙවැනි මණ්ඩලයක් පත්කල හැක්කේ වර්ෂයක කාලයක් සඳහා පමණි. ඊට පසුව බැංකු සංගමයේ මහ සභාව පවත්වා අළුත් පාලක මණ්ඩලයක් සාමාජිකත්වය තුලින් තෝරාගත යුතුව ඇත. මීට අමතරව බැංකු සංගම් කළමනාකරු ඇතුළු සේවක මණ්ඩලයේ අක්‍රමිකතා ඇත්නම්, ඒ පිළිබඳ විනය කටයුතු කිරීමට පාලක මණ්ඩලයට උපදෙස්දීමට මහ සංගමයට පුලුවන. මහ සංගම් ව්‍යවස්ථාවේ 9:21 වගන්තියේ පහත සඳහන් පරිදි දැක්වේ. " සමෘද්ධි බැංකු සංගම්වල සේවක මණ්ඩලවල ඕනෑම තනතුරක් දරණ කෙනෙකුගේ විෂමාචාරයෙක්, මුදල් වංචාවක් හෝ අක්‍රමිකතාවක් පිළිබඳව මහ සංගමයේ පරීක්‍ෂණයකින් අනාවරණය වුවහොත් ඒ පිළිබඳව විනයානුකූලව කටයුතු කිරීමට පාලක මණ්ඩලයට උපදෙස්දීමට විධායක කමිටුවට හැක. එම උපදෙස් පිළිපැදීමට පාලක මණ්ඩලය බැඳී ඇත.

සමෘද්ධි සමිති පිළිබඳවද සමෘද්ධි මහ සංගමයට පාලන බලතල ඇත. කිසියම් සමෘද්ධි සමිතියක් නිසි පරිදි ක්‍රියාත්මක නොවේ නම් එම සමිතිය විසුරුවා හැර, අළුතින් සාමාජිකත්වය කැඳවා නව නිලධාරී මණ්ඩලයක් පත්කිරීමට මහ සංගමයට කටයුතු කළ හැක. මහ සංගම් ව්‍යවස්ථාවේ 9 :17 වගන්තිය එය මෙසේ දැක්වේ. "සමෘද්ධි සමිතිවල අක්‍රමිකතාවක් හෝ වෙනත් දුර්වලතාවක් ඇත්නම්, එම සමිතිය විසුරුවා හැරීමටත්, අළුතෙන් නිලවරණ පැවැත්වීමටත් විධායක කමිටුවට හැක." මේ අනුව මහ සංගමයට සමෘද්ධි සමිති හා බැංකු සංගම් පාලනය කිරීමේ වගකීම වෙන්ම ඒ සඳහා අවශ්‍ය බලයද ලබාදී ඇති බව පෙනේ.

## 2. මානව සම්පත් සංවර්ධනය

සමෘද්ධි මහ සංගමය මඟින් මානව සම්පත් සංවර්ධනය කිරීමේ විශේෂ ඒකකයක් ගොඩනැගිය යුතුය. නූතන සංවර්ධනවේදීන් විසින් සංවර්ධනයේ ඉතාමත් වැදගත් අංශය ලෙස දක්වන්නේ මානව සම්පත් සංවර්ධනයයි. මානව සම්පත් සංවර්ධනය යටතේ තුන් ආකාරයක කටයුතුවලට මහ සංගමයට මැදිහත්වීමට පුලුවන.

A - ප්‍රතිලාභින්ගේ වෘත්තිය හා තාක්‍ෂණ ව්‍යවසායකත්ව පුහුණුව

B - කාර්ය මණ්ඩල පුහුණුව

C - සමාජ සජීවිකරණ කටයුතු

### A - ප්‍රතිලාභින්ගේ වෘත්තිය හා තාක්‍ෂණ ව්‍යවසායකත්ව පුහුණුව

සමෘද්ධි බැංකු සංගම් වලින් ණය ලබාගැනීමේදී විවිධ නිෂ්පාදන හා සේවා කටයුතු සඳහා එය කරනු ලැබේ. මෙම නිෂ්පාදන හා සේවා කටයුයතු වැඩිදුර දියුණු කිරීම සඳහා වෘත්තිය පුහුණුව, නව තාක්‍ෂණය ලඟාකිරීම, ව්‍යවසායකත්ව හැකියා වර්ධනය කිරීම අවශ්‍යවේ. උදාහරණයක් ලෙස කුකුල් පාලනය සඳහා ණය ලබාගන්නා සාමාජිකයින් හඳුනාගෙන, ඔවුන්ට කුකුල් පාලනය පිළිබඳ ප්‍රායෝගික ගොවිපොල පුහුණුවක් ලබාදීමට හැක. එවිට ඔහුන්ගේ දැනට කරනු ලබන කුකුල් පාලනය වඩාත් විධිමත්ව දියුණු කර ගැනීමට ඉඩකඩ සැලසේ. මේ අන්දමට වෙනත් වෘත්තින්වලටද කෙටි කාලින පුහුණුවීම් ලබාදිය හැක. මෙම පුහුණුවීම් ප්‍රතිලාභින් විසින්ම සොයාගෙන ගොස් ලබාගැනීම බොහෝවිට සිදු නොවේ. එහෙයින් මහ සංගමය එවැනි පුහුණුවීම් කළ යුතුව ඇත. මෙහිදී වැදගත් වන්නේ පුහුණුවට තෝරාගැනීම, දැනටමත් ණය අරමුදල් ලබාගෙන කරනු ලබන වෘත්තින්වලට වඩාත් නැඹුරු කිරීමය. එසේ නොකර තරුණයින් එක්කර ලබාදෙන බොහෝ පුහුණුවීම් වලින් එතරම් ඵලදායි ප්‍රතිඵල ලැබෙන්නේ නැත. මේ සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන දැනටමත් සමෘද්ධි මහ සංගම්වලට ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියෙන් ලබාදීම අරඹා ඇත. එමෙන්ම මෙහිදී ප්‍රදේශයේ

කෘෂිකර්ම, සත්ත්ව පාලන, කුඩා කර්මාන්ත, කාර්මික සංවර්ධන මණ්ඩලය වැනි ආයතනවල සහාය ලබාගැනීමට මහ සංගමයට පුලුවන.

## B - කාර්ය මණ්ඩල පුහුණුව

සමෘද්ධි මහ සංගමයේ හා බැංකු සංගම්වල කාර්ය මණ්ඩලද පුහුණු කිරීම ඉතාමත් වැදගත්වේ. මෙහිදී කාර්ය මණ්ඩලයේ දැනුම හා හැකියාවන් පමණක් නොව ඔවුන්ගේ ආකල්පද වර්ධනය කළ යුතුව ඇත. විශේෂයෙන්ම දුප්පත්කම පිටුදැකීමේ වැඩසටහනකට ගැලපෙන ආකල්ප සේවක මණ්ඩලය තුල ගොඩනැගිය යුතුව ඇත. සම්මත බොහෝ ආයතනවල දුප්පත් ජනතාවට ඇත්තේ ඉතාමත් අඩු ප්‍රමුඛතාවක් හා සැලකිල්ලක් දැක්වීමකි. එම මහත්වරුන්ගේ ආකල්පය වෙනුවට දිළිඳු ජනතාව විශාල විභව ශක්තීන් ඇති සම්පතක් ලෙසත්, තමාගේම සහෝදර ජන කණ්ඩායමක් ලෙසත් සිතන ආකල්ප කාර්ය මණ්ඩලය තුල ගොඩනැගිය යුතුව ඇත.

කාර්ය මණ්ඩලය තුල ඉහත කී ආකල්පවලට අමතරව මූල්‍ය කළමනාකරණය, ග්‍රාමීය බැංකු ක්‍රමය, කාර්යාල කළමනාකරණය, පරිඝණක තාක්‍ෂණය ආදිය පිළිබඳව දැනුම හා හැකියා වර්ධනය කළයුතුව ඇත.. මෙම කටයුතු සඳහා බාහිර ආයතනවලත්, ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේත් සහාය ලබාගැනීමට පුලුවන. ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය මඟින් බැංකු කටයුතු පිළිබඳවත්, ගිණුම් කටයුතු පිළිබඳවත් විශේෂ පුහුණු වැඩසටහන්ද මේ සඳහා සහායට පවත්වා ගෙන යනු ලැබේ.

## C - සමාජ සජීවීකරණ කටයුතු

මානව සම්පත් සංවර්ධනයේදී සමාජ සජීවීකරණ කටයුතුවලට විශාල ප්‍රමුඛතාවක් ලබාදිය යුතු බව පසුගිය දශක කිහිපය තුල අත්දැකීම් වලින් අනාවරණය වී ඇත. මෑත කාලයේදී දිළිඳුකම පිටු දැකීම පිළිබඳව සාක් සමුළුවේ වාර්තාවල සමාජ සජීවීකරණයේ වැදගත්කම ඉතාමත් ඉහලින් දක්වා ඇත. එමෙන්ම මෙම

සමාජ සජීවිකරණ කටයුතු දිගු කාලයක්, එනම් අඩුම වශයෙන් වසර 7 ක් වත් කළ යුතු බව ඇතැම් සාක් කමිටු වාර්තාවල දැක්වේ.

සමාජ සජීවිකරණය මඟින් ගොඩනගන 5 දෙනාගේ කණ්ඩායම් හා සමෘද්ධි සමිති ඉතාමත් වැදගත්වේ. සමාජ සජීවිකරණ ක්‍රියාවලිය තුලින් කරනුයේ විශේෂයෙන්ම දුප්පත් පවුල් වෙළඳපොල ආර්ථික ක්‍රමයට එක්තරා අන්දමකට සූදානම් කිරීමකි. මෙහිදී විශේෂයෙන් දුප්පත් පවුල්වල සංනිවේදන ශක්ති වර්ධනය, දැනුම, හැකියා හා ආකල්ප යන අංශ වලින් ලබාගන්නා නොවිධිමත් අධ්‍යාපනය හා සැලසුම් ක්‍රියාවලියට යොමුවීම යන කරුණු ඉතා වැදගත්වේ. මෙම කටයුතුවලට සමෘද්ධි නියාමකයින් පුහුණු කර සජීවිකරණ කටයුතුවල යෙදිය යුතුව ඇත. ඊට අමතරව ගම්මට්ටමින් මතුවී එන තරුණ තරුණියන් ස්වේච්ඡා සහායක නියාමක පිරිසක් ලෙස පුහුණු කර ක්ෂේත්‍ර කටයුතුවලට යොදාගැනීමේ වැදගත්කම අනාවරණය වෙමින් පවතී. සමෘද්ධි නියාමකවරුන්ට වෙනත් කාර්යයන් බහුලව තිබෙන නිසා ස්වේච්ඡා පිරිසක් මේ සඳහා යොදාගැනීම අවශ්‍ය වී ඇත. නිරන්තරව කුඩා කණ්ඩායම්වලට යෑම හා සමෘද්ධි සමිති රැස්වීම්වලට යාම මෙම ස්වේච්ඡා සහාය නියාමක පිරිසෙන් බලාපොරොත්තු විය හැක.

සමෘද්ධි සමිතිවල සභාපති, ලේකම්, උපසභාපති, උපලේකම් හා භාණ්ඩාගාරික යන පිරිස් ද සමෘද්ධි වැඩසටහන පිළිබඳව නිරන්තරව දැනුවත් කළ යුතුව ඇත. එමනිසා එම පිරිස් වරින් වර කැඳවා පුහුණු කිරීම් හා ප්‍රගති සමාලෝචන වැඩසටහන්වලට යොමුකිරීම ප්‍රයෝජනවත්ය. මෙම කටයුතුවලටද මහ සංගමය මැදිහත් විය යුතුය. විශේෂයෙන්ම ග්‍රාමීය නායකත්ව හැකියාවන් වර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමද වැදගත්වේ.

කුඩා කණ්ඩායම්වල නායකයින්ද වරින් වර පුහුණු කළයුතුය. විශේෂයෙන්ම කුඩා කණ්ඩායම් කටයුතුවල වැදගත්කම, කණ්ඩායම් සාකච්ඡා පවත්වන ආකාරය, කණ්ඩායම් වලින් කළ හැකි විවිධ ක්‍රියාකාරකම්, බැංකු සංගමයෙන් ලබාගන්නා ණය නිර්දේශ කිරීම හා එම ණය කටයුතුවල ප්‍රගතිය සොයා බැලීම වැනි කරුණු පිළිබඳව කණ්ඩායම් නායකයින් දැනුවත් කළ යුතුව ඇත. එමෙන්ම බැංකු

සංගමයේ කටයුතු, සමෘද්ධි සමිතියේ කටයුතු, මහ සංගමයේ කටයුතු පිළිබඳවද කණ්ඩායම් නායකයින් දැනුවත් කළ යුතුය. මෙම දැනුවත් කිරීම තුලින් කුඩා කණ්ඩායම් ක්‍රියාවලිය වඩාත් ශක්තිමත් කිරීමට ඉඩකඩ සැලසේ. මෙම පුහුණුවීම් සඳහා ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ අනුග්‍රාහය ලැබෙන අතර, බාහිර ආයතනවලද සහාය ලබාගැනීමට මහ සංගමය කටයුතු කළ යුතුය.

## 3. ණය අරමුදල් සම්පාදනය

සමෘද්ධි බැංකු සංගම්වල ණය ලබාදීම සඳහා මුල් අවදියේදී යොදාගනු ලබන්නේ සාමාජික කොටස් මුදල් හා ඉතුරුම්ය. බැංකු සංගම් වලින් මුල් අවදියේ ඉතා කුඩා ණය දෙමින් ඔවුන් ණය සංස්කෘතියකට ගැනීමට උත්සාහ ගනු ලැබේ. මෙහිදී "පුංචි ණයයෙන් - ලොකු ණයට" යන සංකල්පයත්, අඛණ්ඩව ණය ලබාදීමත් සිදුවේ. මෙම ක්‍රියාවලියේ හොඳ ලක්ෂණ දෙකක් ඇත. එකක් වන්නේ මෙම ණය සඳහා ලබාදෙන මුදල්, තම තමන්ගේම මුදල් බව දැනගැනීමයි. දෙවැන්න වන්නේ ආයතනයක් සමඟ ණය ගනුදෙනුවකට හුරුවීමයි.

ඉහත දැක්වෙන ක්‍රියාවලිය ටික කලක් ගතවෙන විට තරමක ලොකු ණය සඳහා ඉල්ලුම්කරුවන් පිරිසක් ඇති කරනු ලබයි. එම ඉල්ලුමට සරිලන අන්දමට දුප්පතුන්ගේ ඉතුරුම් වර්ධනය කළ නොහැක. මේ නිසා සමෘද්ධි බැංකු සංගම්වලට බාහිර ණය අරමුදල් සැපයිමේ අවශ්‍යතාව මතුවේ. මෙහිදී මහ සංගමය මඟින් එම අරමුදල් ලබාදීමේ වැඩසටහනක් සම්පාදනය කළ යුතුව ඇත. ඇත්ත වශයෙන්ම දැනට ග්‍රාමීය දුප්පතුන් නඟා සිටුවීමට ඇති ලොකුම බාධාව වන්නේ ණය ලබාදී ආපසු අයකර ගැනීමට ශක්තිමත් යන්ත්‍රණයක් නොමැතිකමයි. මේ සඳහා සමෘද්ධි බැංකු සංගම් එක්කර ගොඩ නැගෙන මහ සංගමය විකල්ප යන්ත්‍රණයක් බවට පත්වේ. එසේ ග්‍රාමීය දුප්පත් ජනතාවට මහ ආර්ථිකයෙන් හෝ විදේශිය අරමුදල් ණය වශයෙන් යවා, ආපසු අයකර ගැනීමට පුලුවන් නම් දිළිඳුකම පිටුදැකීමේ ලොකුම බාධකයක් නැති කලාවේ. පසුගිය දශක කිහිපය තුල සම්මත බැංකු හා විවිධ සංවිධාන වක්‍රිය අරමුදල් තුලින් වගා ණය, ජනසවි ණය, නිවාස ණය ආදී ණය ලබාදුන්නත්, ඒවා ආපසු අයකර ගැනීම ඉතාමත් දුර්වලවිය. මෑතකදී සමෘද්ධි වැඩසටහන මඟින් බැංකු හරහා ලබාදුන් සසුණ ණය ද ආපසු අයවීම

62% ක් පමණවේ. මෙය කිසිසේත්ම ආර්ථික වශයෙන් පවත්වාගෙන යාහැකි ණය ක්‍රමයක් නොවේ. එමෙන්ම වසරකට වරක් හෝ දෙවරක් දුප්පතුන් වෙත ලබාදෙන ණය ක්‍රමයක් තුලින් ඔවුන්ගේ එදිනෙදා අවශ්‍ය වන ප්‍රාග්ධනය ලඟා කිරිමට නොහැක. මේ නිසා සමෘද්ධි මහ සංගමය හරහා සාර්ථකව සමෘද්ධි බැංකු තුලින් ණය අරමුදල් සම්පාදනය ඉතා වැදගත්වේ.

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය මඟින් ඉදිරි කාලයේදී සමෘද්ධි බැංකු සංගම්වලට ඔවුන්ගේ කොටස් හා ඉතුරුම්වලට සමානුපාතිකව ණය අරමුදල් ප්‍රමාණයක් ප්‍රතිපූරණ පදනමක් යටතේ ණය වශයෙන් ලබාදීමට සැලසුම් කර ඇත. මේ සඳහා මුලදී සමෘද්ධි ලොතරැයියෙන් ලැබෙන අරමුදල් වලින් 60% ක් යොදාගනු ලැබේ. ඉදිරියේදී වෙනත් රජයේ අරමුදල්, සංවර්ධන භාරකාර අරමුදලේ ණය අරමුදල් මේ සඳහා යොදාගැනීමට කටයුතු කරගෙන යනු ලැබේ. මුලදී කොටස් හා ඉතුරුම් මුදල් ප්‍රමාණයට සමානුපාතික මුදල් ප්‍රමාණයක් ලබාදුන්නත්, පසුව එහි උපරිමය කිහිප ගුණයකින් වැඩි කිරීමට බලාපොරොත්තුවේ. එය කරනු ලබන්නේ මහ සංගම් මඟින් ණය අරමුදල් ආපසු ගෙවීමේ කාර්යක්ෂමතාව හා බැංකු සංගම්වල ණය අයවීමේ ප්‍රතිශතකය ආදිය සලකා බැලීමෙන් පසුවය. කෙසේ නමුත් සමෘද්ධි මහ සංගම් මඟින් 90% කට වඩා අඩුවෙන් ණය ආපසු අයකරන බැංකු සංගම්වලට ප්‍රතිපූරණය ණය අරමුදල් නිදහස් නොකළ යුතුය. මේ පිළිබඳ කොන්දේසි ඇතුලත් ගිවිසුමක් සමෘද්ධි අධිකාරිය මඟින් සමෘද්ධි මහ සංගම් සමඟ ඉදිරි කාලයේ අත්සන් කරනු ලැබේ.

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ ණය අරමුදල් ලබාදෙන්නේ ප්‍රතිපූරණ පදනම යටතේය. ඒ අනුව මුලින් බැංකු සංගම් වලින් තම අරමුදල් යොදවා ණය නිකුත් කල යුතුය. ඊට පසුව ඒවා මහ සංගමය හරහා ප්‍රතිපූරණය කරනු ලැබේ. ලබාගන්නා වගා ණය හැරුනු විට අනෙකුත් සියළුම ණය මාසික වාරික වශයෙන් ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියට ගෙවිය යුතුය. වගා ණයවලට පමණක් මාස 6 ක සහන කාලයක් ලබාදේ. ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය මඟින් ණය අරමුදල් 5% ක පොලියකට ලබාදෙන අතර මහ සංගමය විසින් පොලිය 10% කට සමෘද්ධි බැංකු සංගම්වලට ලබාදේ. මේ නිසා මහ සංගමයට ලැබෙන 5% කොමිස් මුදල් මඟින් එම සංගමයේ පරිපාලන වියදම් පියවා ගතහැක. එමෙන්ම මහ සංගම් නිසි පරිදි කටයුතු කරන්නේ නම් ඉතා හොඳ ආදායම් මාර්ගයක් බවට ද මෙය

පත්වේ. මහ සංගම් කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා මෙම ආදායම් මාර්ග යොදාගැනීමට පුලුවන.

## 4. බැංකු සංගම් සංරක්ෂණය

සමෘද්ධි මහ සංගමයේ තවත් ප්‍රධාන වගකීමක් වන්නේ බැංකු සංගම් හා මහ සංගමයේ අරමුදල්ද මනා සංරක්ෂණ ක්‍රමයකට යටත් කිරීමය. විශේෂයෙන්ම සමෘද්ධි බැංකු සංගම් මූල්‍ය ආයතන ලක්ෂණ සහිත හෙයින් සංරක්ෂණය ඉතා වැදගත්ය. මෙහිදී සම්මත රක්ෂණ ආයතන යොදා ගැනීම අතිශයින් දුෂ්කරය. එමනිසා සුවිශේෂ සංරක්ෂණ ක්‍රම ඇති කිරීමට මෙහිදී කටයුතු කර ඇත. විශේෂයෙන්ම දුප්පතුන් සමඟ කටයුතු කරන මූල්‍ය ආයතනවල සංරක්ෂණය පිළිබඳ කලාපයේ විවිධ අත්දැකීම් ලබා ඇත. එවැනි සංරක්ෂණ ක්‍රම වලින් තොරව වැඩසටහන ක්‍රියාත්මක කලහොත්, විවිධ ආපදාවන් නිසා බැංකු සංගම් බංකලොත්වීමට ඉඩ ඇත. එසේ එක් බැංකු සංගමයක් හෝ කඩා වැටීම සමස්ථ වැඩසටහනටම බලපානු ලැබේ.

### 4.1 අතරැඳි හා ප්‍රවාහනය කරනු ලබන මුදල් සංරක්ෂණය

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය මඟින් බැංකු සංගම්වල අතරැඳි මුදල් හා වාණිජ බැංකුවලට ප්‍රවාහනය කරන මුදල් සංරක්ෂණය කරනු ලැබේ. මෙය අර්ධ වාර්ෂික සංරක්ෂණ ක්‍රමයක් ලෙස දැනට ක්‍රියාත්මකවේ. මෙහිදී මහ සංගම් විසින් ඒ ඒ බැංකු සංගම් ප්‍රමාණවත් පරිදි හා නිසි වේලාවට සංරක්ෂණය කරනවාද යන්න සොයාබැලීම වැදගත්ය. සමහර බැංකු සංගම් මේ ගැන සැලකිල්ල දැක්වීම මඳවීමට පුලුවන. එවිට කිසියම් හේතුවක් නිසා මංකොල්ලකෑමක් හෝ සොරකමක් සිදුවුවහොත් බැංකු සංගමයට මූල්‍ය ප්‍රශ්ණ මතුවේ. මේ නිසා මෙම අතරැඳි මුදල් සංරක්ෂණය ගැන මහ සංගමය සොයා බලා, අවශ්‍ය උපදෙස් බැංකු සංගම්වලට ලබාදිය යුතුව ඇත.

## 4.2 ණය සංරක්ෂණය

ණය සංරක්ෂණ අරමුදල ගොඩනැගෙන්නේ මහ සංගමය තුල වන අතර, එය පාලනය කරනු ලබන්නේ මහ සංගමය මඟින්ය. මෙහිදී සමෘද්ධි බැංකු සංගම්වලින් සාමාජිකයින් වෙත නිකුත් කරන ණයවලට එක්තරා ප්‍රමාණයක ආරක්ෂණයක් ලබාදීමට බලාපොරොත්තුවේ. විශේෂයෙන්ම සමෘද්ධි බැංකු සංගම්වල ණය නිකුත් කරනු ලබන්නේ කුඩා කණ්ඩායම් විශ්වාසය මතය. එහෙත් ණය අයකර ගැනීමේදී කුඩා කණ්ඩායම් බලපෑමට හසුකර ගැනීමට නොහැකි වෙන අවස්ථා ඇත. විශේෂයෙන්ම ණය ලාභීන්ගේ පාලනයට හසු නොවන හේතුන් නිසා ණය ආපසු ගෙවා ගැනීමට නොහැකිවන අවස්ථා ඇත. එවැනි අවස්ථා 6 ක් පහත දැක්වේ.

1. ණය ලබාගත් සාමාජිකයා මියයාම.
2. ණය ලාභියා සදාකාලික ආබාධිතවීම.
3. නියඟය, ගංවතුර වැනි ස්වාභාවික විපත්.
4. ගිනි ගැනීම.
5. සොරකම.
6. ත්‍රස්තවාදී විපත්.

ඉහත සඳහන් හේතු නිසා ණය බැංකු සංගමයට ගෙවා ගැනීමට නොහැකිවන අවස්ථා ඇත. මෙවැනි අවස්ථාවලදී කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින්ගේ බලපෑම එතරම් ප්‍රයෝජනවත් නොවේ. එහෙයින් මෙම අවස්ථාවල බැංකු සංගමයට සිදුවන පාඩුව වලකාලීම සඳහා ණය සංරක්ෂණය ඇති කර ඇත. මෙහිදී සංරක්ෂණ වාරික ගෙවනු ලබන්නේ බැංකු සංගමය විසින්ය. සාමාජිකයෙකුට නිකුත් කරන ණය මුදලින් 1% ක් මෙම සංරක්ෂණය සඳහා මාසිකව බැංකු සංගම් මහ සංගමයට ගෙවිය යුතුය. පාරිභෝගික ණය හැරුණු විට අනෙකුත්, සියළුම ණය සඳහා සංරක්ෂණය ගැනීමට බැංකු සංගම් කටයුතු කළ යුතුය. ඉහත දක්වන ලද හේතුන් මත කිසියම් ණය මුදලක් බැංකු සංගමයට නොලැබේ නම් ඒ පිළිබඳ වාර්තා ලබාගෙන ණය සංරක්ෂණ අරමුදලින්

බැංකුවට වු පාඩුව ගෙවා දමනු ලැබේ. මේ නිසා කුඩා කණ්ඩායමට අනවශ්‍ය බරක් පැටවීම නැතිවේ. මෙම ණය සංරක්ෂණ ක්‍රමය හම්බන්තොට කාන්තා මහ මංගමය මහින් ඉතාමත් සාර්ථකව ක්‍රියාත්මක කර අත්දැකීම් ලබාගෙන ඇත.

## 4.3 සමුහ සංරක්ෂණ අරමුදල

බංගලාදේශයේ ග්‍රාමීන් බැංකුව හා බ්‍රැක් ආයතනය දුප්පතුන් උදෙසා සාර්ථකව ණය වැඩසටහන් ක්‍රියාත්මක කරන ආයතන දෙකකි. මෙම සංවිධාන දෙකේම ණය නිකුත් කිරීමේදී 5% ක් කපාගනිමින් සමුහ සංරක්ෂණ අරමුදල් ගොඩනගා ඇත. මෙම ක්‍රමය හම්බන්තොට කාන්තා මහ සංගමයේත් ක්‍රියාත්මකවේ. එහි 1998 අප්‍රේල් 30 වැනි දිනට ලැබී ඇති ප්‍රගති වාර්තාව අනුව සමුහ සංරක්ෂණ අරමුදල වශයෙන් රුපියල් එක්කෝටි දොලොස් ලක්ෂය (රු. 11,211,670/-) ඉක්මවා මෙම අරමුදල තරකරගෙන ඇත. මෙම අරමුදල ගොඩනැගීමේ මුලික අදහස වන්නේ බැංකු සංගම් කිසියම් හේතුවක් නිසා බිඳවැටීමට ලක් වුවහොත්, එවැනි අවස්ථාවට පිහිටවීමය. හම්බන්තොට ජනශක්ති බැංකු සංගම්වල සුරක්ෂිතභාවයට මෙම සමුහ සංරක්ෂණ අරමුදල විශාල පිටුබලයක් වී ඇත. මේ අනුව සමෘද්ධි බැංකු සංගම්වලද ණය නිකුත් කිරීමේදී 5% ක මුදලක් කපාගෙන, සමුහ සංරක්ෂණ අරමුදලක තැන්පත් කරනු ලැබේ.

සමුහ සංරක්ෂණ අරමුදලේ අරමුණු ගැන සාමාන්‍ය සාමාජිකත්වය එතරම් සැලකිල්ලක් නොදක්වන බවද අප විසින් තේරුම් ගත යුතුව ඇත. එම සාමාජිකයින් විසින් මෙම 5% කපා ගැනීම පිළිබඳ නිරන්තරව ප්‍රශ්න කරනු ලැබේ. එම නිසා එම පිරිසටද කෙටි කාලීන හා දිගු කාලීන පෞද්ගලික ප්‍රතිලාභ දැනෙන්නට සැලැස්විය යුතුව ඇත. මේ නිසා මෙම සමුහ සංරක්ෂණ අරමුදලට කපා ගන්නා 5% ක මුදලින් 50% ක් පාරිභෝගික අරමුදලකට වෙන් කෙරේ. ඉතිරි 50% ක මුදල ආපදා අරමුදලකට වෙන් කෙරේ.

## A පාරිභෝගික අරමුදල

ණය නිකුත් කිරීමේදී 5% ක් සමූහ සංරක්ෂණ අරමුදලට කපාගන්නා බව ඉහතින් සඳහන් විය. එයින් 50% ක් පාරිභෝගික අරමුදලට බැර කෙරේ. මෙම අරමුදලින් "පාරිභෝගික ණය" යනුවෙන් 1½% ක මාසික සහන පොලියක් යටතේ ණය නිකුත් කරනු ලැබේ. මෙම අරමුදලේ පාරිභෝගික ණය ඉල්ලුම් කළ හැක්කේ වෙනත් ණය බැංකු සංගමයෙන් ලබාගෙන සමූහ සංරක්ෂණ අරමුදලට දායක වූ සාමාජිකයින්ට පමණි. මෙම පාරිභෝගික ණය සාමාජිකයාගේ ඕනෑම අවශ්‍යතාවක් සඳහා ලබාගැනීමට පුලුවන. මුලදී මෙම අරමුදල විශාල නොවන නිසා කුඩා ප්‍රමාණයේ ණය නිකුත් කරනු ලැබේ. නමුත් මෙම අරමුදල විශාලවීමත් සමඟ පාරිභෝගික ණය මුදලේ උපරිමය වෙනස් කල හැක. මෙම ණය උපරිමය වරින් වර පාලක මණ්ඩලය විසින් විමර්ශනය කර ණය උපරිමයන් තීරණය කළ හැක. කෙසේ නමුත් මෙම පාරිභෝගික ණය සඳහා එම අරමුදලින් බැහැර බැංකු සංගමයේ අරමුදල් යොදා ගැනීමට නොහැක. එම අරමුදලේ මුදල් නොමැති විට ලැබෙන ණය ඉල්ලුම් පත් පොරොත්තු ලේඛනයක තබා අරමුදලට ලැබෙන මුදල් ප්‍රමාණය අනුව පසුව ණය නිකුත් කළ හැක. තවද පාරිභෝගික ණය සඳහා නැවත සමූහ සංරක්ෂණ අරමුදලට 5% ක් කපාගන්නේ නැත. එමෙන්ම මෙම ණය සඳහා ණය සංරක්ෂණයට මුදල් මහ සංගමයට ගෙවීමද අවශ්‍ය නොවේ. මෙම පාරිභෝගික ණය ඉල්ලුම් කිරීමේදී සමෘද්ධි සමිතියේ අනුමත කර, නැවත පාලක මණ්ඩලයේ අනුමැතිය වෙත යොමු කිරීමේ සාමාන්‍ය ක්‍රියාවලියද අදාල වන්නේ නැත. පාරිභෝගික ණය බැංකු සංගම් කළමනාකරුට නිකුත් කළ හැක. නමුත් ඊළඟ පාලක මණ්ඩලයට ඒ පිළිබඳව වාර්තා කර අනුමැතිය ගත යුතුව ඇත. විශේෂයෙන් ග්‍රාමීය ණය ගැතිභාවය ගැන කරන ලද සමීක්ෂණවලදී පාරිභෝගික ණය වලද වැදගත්කම පෙන්නාදී ඇත. මෙම ණය බැංකු සංගමයෙන් ලබා නොදුනහොත්, නැවත දුප්පල් පවුල් හදිසි අවශ්‍යතාවන් සඳහා ගිනි පොලිකරුවන් ලඟට ගමන් කිරීමට ඉඩ ඇත. එහෙයින් මෙම ණය ක්‍රමය දුප්පත් ග්‍රාමීය ජනතාවට ඉතාමත් ප්‍රයෝජනවත්වේ.

B - ආපදා අරමුදල

සමූහ සංරක්‍ෂණ අරමුදලට කපාගන්නා මුදල් වලින් ඉතිරි 50% ක මුදල බැරවන්නේ ආපදා අරමුදලටය. මෙම අරමුදල මඟින් ණය ලබාගන්නා සාමාජිකයින්ට එක්තරා රක්‍ෂණ ක්‍රමයක් ලබාදේ. එනම් ණය එකක් හෝ දෙකක් ලබාගෙන තිබෙන විට මිය ගියහොත් රු. 1000/- ක් වන්දි වශයෙන් එම පවුලට ලබාදේ, ණය තුනක් ලබාගෙන තිබුනොත් රු. 1500/- ක් වන්දි වශයෙන් ලබාදේ. මේ අන්දමට ණය ගන්නා වාරයකට රු. 500/- බැගින් රක්‍ෂණ වන්දිය වැඩිවේ. රක්‍ෂණ වන්දිය උපරිම මුදල රු. 5000/- කි. මීට අමතරව ණයලාභියා සදාකාලික ආබාධිත තත්ත්වයකට පත්වුවහොත් රු. 1000/- ක් ලබාදේ. මෙම ආපදා අරමුදල නිතරම මහ සංගමයේ සංචිතයක් ලෙස තැන්පත් කළ යුතුය. එය මාසිකව සොයා බලා මහ සංගමයට ගෙන්වා ගත යුතුය. ඊට පසුව එම සංචිත ඵලදායි ආයෝජනවලට යොමු කළ යුතුය. එම ආයෝජනය පොලියෙන් 10% ක් මහ සංගමයට තබාගෙන ඉතිරි මුදල් අදාල බැංකු සංගමයට ලබාදිය යුතුය. මෙම ආපදා අරමුදල මහ සංගමයට ගනු ලබන්නේ, බැංකු සංගමයේ එදිනෙදා ගණුදෙනුවලට මෙම මුදල් යොදුවහොත්, බැංකුව කිසියම් ආපදාවකට මුහුණ පැවිට මෙම අරමුදලේ පිහිට ලබාගැනීමට නොහැකි වෙන හෙයින්ය. මෙම සමූහ සංරක්‍ෂණ අරමුදල මඟින් බැංකු සංගමයට දිගු කාලීන සුරක්‍ෂිතභාවක් ඇති කරනු ලැබේ.

## 4:4 බොල් ණය කපා හැරීමේ සංචිතය

සමෘද්ධි බැංකු සංගම්වල ආරක්‍ෂණය සඳහා බොල් ණය කපාහැරීමේ සංචිතයක් ගොඩනැගීම සහ එම සංචිත මහ සංගමය හරහා සුරක්‍ෂිත ආයෝජනවලට යොමු කිරීමද මහ සංගමය විසින් කළ යුතු කාර්යයක්වේ. සමෘද්ධි බැංකු සංගම්වල ප්‍රධාන කාර්ය වන්නේ තම සාමාජිකයින්ට ණය අරමුදල් සැපයීමය. මෙම ණය අරමුදල් වලින් යම්කිසි ප්‍රමාණයක් විවිධ හේතූන් නිසා අයකර ගැනීමට නොහැකිවේ. මෙම අයකර ගැනීමට නොහැකිවන ණයවලින් කොටසක් ණය සංරක්‍ෂණයෙන් ආවරණයවේ. නමුත් එම සංරක්‍ෂණයෙන් ආවරණය නොවන ණය

ද ඇතිවේ. උදාහරණයක් ලෙස ණයලාභියා විදේශගත වීමක් හෝ ප්‍රදේශය අතහැරයාමක් හදිසියේ සිදුවුවහොත්, සමහරවිට එම ණය අරමුදල් අයකර ගැනීම උගහටවේ. එය ණය ආරක්ෂණයට ඇතුලත් වන්නේද නැත. එහෙයින් මෙවැනි විවිධ හේතුන් නිසා කාලයක් යනවිට අයකර ගැනීමට නොහැකි බොල් ණය ඇතිවේ. මෙම බොල් ණය කපාහැරීම සඳහාද බැංකු සංගමය තුල විශේෂ අරමුදලක් තිබිය යුතුව ඇත.

බොල් ණය කපාහැරීමේ සංචිතය ගොඩනැගෙන්නේ වාර්ෂික ලාභයෙන් 20% ක් වෙන් කිරීමෙන්ය. මෙම 20% ක වෙන්කරන මුදල වෙනම සංචිතයක් වශයෙන් තැබිය යුතු අතර, එය මහ සංගමය මඟින් බාහිර සුරක්ෂිත ආයෝජනවලට යොමු කළ හැක. එසේ නොවුනහොත්, එම අරමුදලද ණයදීමට භාවිතාවේ. එවිට පසු කාලීන විගණන වාර්තා වලින් පෙන්නා දෙන බොල් ණය කපාහැරීම ගැටළුවක්වේ. එහෙයින් මෙම සංචිතය ගැන සොයා බලමින්, එම සංචිත මහ සංගමයට ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. එම ගෙන්වා ගන්නා සංචිත ඵලදායි ආයොජනවලට යොමු කිරීම මහ සංගමයේ කාර්යයක්වේ. පසු කාලීනව බැංකු සංගම්වල බොල්ණය නිසි පරිදි කපාහැරීමට මෙම සංචිතය භාවිතා කළ යුතුව ඇත. හම්බන්තොට කාන්තා සංවර්ධන මහ සංගමය තම ජනශක්ති බැංකු සංගම් 67 වෙනුවෙන් බොල්ණය සංචිතයක් ඇති කර ඇත. 1998 අප්‍රේල් 30 වැනි දින ප්‍රගති වාර්තාවට අනුව කාන්තා සංවර්ධන මහ සංගමයේ බොල් ණය කපා හැරීමේ සංචිතයේ අගය රු. 8,657,887/- කි. මෙම අරමුදල මඟින් ඉදිරියට එන බොල් ණය කපාහැරීම් කරනු ලැබේ. නමුත් එසේ කපා හරිනු ලබන්නේ අදාල බංකු සංගමයේ බොල් ණය සංචිතයෙන්, අදාල බැංකුවේ බොල් ණය පමණි. මේ අනුව සමෘද්ධි බැංකු සංගම්වල දිගු කාලීන පැවැත්මට බොල් ණය කපා හැරීමේ සංචිත ගොඩ නැගීම වැදගත් වන අතර, ඒ ගැන සොයා බලා එම සංචිත ගොඩනැගීම හා එම අරමුදල් ඵලදායි ආයෝජනවල යෙදවීම මහ සංගමය මඟින් කළ යුතුය.

## 4.5 කොටස් මුදල් හා ඉතුරුම් සුරක්ෂිත ආයෝජනවලට යොමු කිරීම

සමෘද්ධි බැංකු සංගම්වල අරමුදල් අතර සාමාජිකයින්ගේ කොටස් මුදල් හා ඉතුරුම් තැන්පතු ප්‍රධාන තැනක් ගනී. මෙම අරමුදල්වල දිගු කාලීන ආරක්ෂාව ඇති කිරීම ගැන මහ සංගමය විශේෂ අවධානයක් යොමු කළ යුතුව ඇත. මුල් වර්ෂවල සාමාජික කොටස් හා ඉතුරුම් වලින් 80% ක්ම ණය ලබාදීම සඳහා භාවිතාවේ. මෙසේ කිරීමට හේතුන් දෙකක් ඇත. එකක්වන්නේ සාමාජිකයින්ට ඔවුන්ගේම ඉතුරුම් තුලින් ණය ලබාදෙන බව අත්දැකීමෙන් ඉගෙනීමට සැලැස්වීමයි. රජයේ මුදල් හෝ වෙනත් බාහිර අරමුදල් වලින් ණය දෙන බව සාමාජිකයින් ආරම්භයේදී දැනගතහොත්, ඒවාද සහනාධාර මෙන් සැලකීමට ඉඩ ඇත. එවිට එම ණය පැහැර හැරීමට පෙළඹේ. දෙවෙනි කරුණ වන්නේ සමෘද්ධි බැංකු සංගම්වලට බාහිර අරමුදල් මුලදී ගලා නොඒමයි. ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියෙන් පවා ණය අරමුදල් ලබාදෙන්නේ වසරක් තම අරමුදල් වලින් ණය ලබාදී අත්දැකීම් ලබාගැනීමෙන් පසුවය. එමෙන්ම පළමුවන විගණන වාර්තා ගැන සමෘද්ධි අධිකාරිය ණය අරමුදල් ලබාදීමට පෙර පරීක්ෂා කර බලනු ලැබේ.

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියෙන් ණය අරමුදල් ලබාදීමට ආරම්භ වු පසු සමෘද්ධි බැංකු සංගම් ක්‍රම ක්‍රමයෙන් තම කොටස් අරමුදල් හා ඉතිරිකිරීම් වලින් කොටසක් මහ සංගමය හරහා සුරක්ෂිත ආයෝජනවල යෙදිය යුතුය. කොටස් මුදල් 100% ක්ම හා ඉතුරුම්වලින් 35% ක් මෙසේ ආයෝජන කිරීම ප්‍රශස්ථ මට්ටමවේ. මේ ගැන මහ සංගමය බැංකු සංගම් දැනුවත් කරමින් ඒ වෙත යොමු කළ යුතුය. මෙසේ කිරීම නිසා බැංකු සංගමයට දිගු කාලීන සුරක්ෂිතභාවක් මෙන්ම, ආදායම් මට්ටමේ වර්ධනයක් ද ඇති කර ගැනීමට පුලුවන. ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියද මහ සංගම්වල කාර්ය ඵලය මැනීමේදී මෙම කරුණු අනාගතයේදී සැලකිල්ලට ගනී. හම්බන්තොට කාන්තා සංවර්ධන මහ සංගමය ජනසවි භාරකාර අරමුදල් ණය අරමුදල් වශයෙන් ලබා කර ගැනීමේදී ඉහත දැක් වු අන්දමට කොටස් අරමුදලේ හා ඉතරුම් වලින් කොටසක් මහ සංගමය හරහා ආයෝජනය කරන ලදී. මෙය ජනශක්ති බැංකු සංගම්වලට දිගු කාලීන සුරක්ෂිතභාවයක්

ඇති කිරීමට හේතු වී ඇත. මෙම අත්දැකීම සමෘද්ධි බැංකු සංගම්වලට ඉතාමත් පහසුවෙන් අනාගතයේදී ගලපා ගැනීමට පුලුවන.

## 5. බාහිර ආයෝජන කටයුතු

සමෘද්ධි බැංකු සංගම්වල මහ බැංකුව ලෙස සමෘද්ධි මහ සංගමය බොහෝදුරට හැඳින්වීමට පුලුවන. මහ බැංකුව වාණිජ බැංකු ජාලයෙහි කරනු ලබන විවිධ පාලන උපක්‍රම සමෘද්ධි මහ සංගමය විසින් සමෘද්ධි බැංකු විෂයෙහි භාවිතයට ගනු ලැබේ. විශේෂයෙන් සමෘද්ධි බැංකු සංගම්වල අරමුදල් වඩාත් ඵලදායි හා සුරක්ෂිත ආයෝජනවල යෙදවීම මහ සංගමය විසින් කළ යුතුව ඇත. මෙහිදී මහ සංගමය වාණිජ බැංකුවල හා වෙනත් ආයෝජන මාර්ගවල තොරතුරු රැස්කරමින් වඩාත් ඵලදායි ආයෝජනවල බැංකු සංගම්වල අතිරේක මුදල් යෙදවිය යුතුය. මෙහිදී අතිරේක මුදල් යනුවෙන් අදහස් කරනුයේ බැංකු සංගම් තම සාමාජිකත්වයට නිකුත් නොකර ඉතිරිවෙන අරමුදල්ය. මහ සංගමයට බැංකු සංගම් ගණනාවක අරමුදල් එක්තැන් වෙන නිසා පරිමානුකූල වාසි ලබා කර ගැනීමට පුලුවන. ආයෝජන මුදල් ප්‍රමාණය වැඩිවෙන විට වැඩි පොලී අනුපාත ලබාදීමට බොහෝ මූල්‍ය ආයතන ඉදිරිපත්වේ. තවත් පැත්තකින් විශාල මුදල් ප්‍රමාණයක් තිබෙන විට මූල්‍ය ආයතන අතර කේවල් කිරීමේ ශක්තියද මහ සංගමයට වැඩිවේ.

සමෘද්ධි මහ සංගමය හරහා ඉදිරියේදී බැංකු සංගම්වලට ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය ණය අරමුදල් සම්පාදනය කරනු ලැබේ. මෙහිදී තම කොටස් හා ඉතුරුම් මුදල් වලින් කොටසක් මහ සංගමය හරහා බාහිර ආයෝජනයට යොමු කිරීම බැංකු සංගම්වලටත්, මහ සංගමයටත් වැඩි වාසියක් ගෙනදේ. මීට අමතරව බාහිර ආයතන වලින්ද ඉදිරියේදී විවිධ ආධාර යටතේ ව්‍යාපෘතිවලට මුදල් ලැබීමට මහ සංගම්වලට ඉඩ ඇත. එවැනි මුදල් ලැබුනු විට ද එම වියදම්වල ස්වභාවය බලා අතිරේක මුදල් බාහිර ආයෝජනවලට යොමු කිරීමට මහ සංගමයට පුලුවන. එසේ කිරීම තුලින් මහ සංගමයට අතිරේක ආදායම් උපයා ගැනීමට ඉඩකඩ ඇත. මීට අමතරව ඉහත සඳහන් කරන ලද මහ සංගමය වෙත ගලා එන ආපදා අරමුදල්, ණය සංරක්ෂණ අරමුදල්, බොල් ණය කපා හැරීමේ සංචිත වැනි අරමුදල් ද බාහිර ආයෝජනවල යෙදවීම මහ සංගමය මඟින් කළ යුතුව ඇත.

## 5. බහුවිධ සංවර්ධන ප්‍රවේශය



දුප්පත්කම බහුවිධ හේතුන් නිසා ඇතිවන්නකි. බොහෝවිට පැහැදිලිව ආර්ථික හේතුන් බල පවත්වන අවස්ථා ඇත. උදාහරණයක් ලෙස වත්කම් නැතිකම, නිෂ්පාදනය සඳහා ප්‍රාග්ධනය නොමැතිකම ආදිය දැක්විය හැක. තවත් සමහරවිට නොදැනුවත්කම, නොහැකියාව හා ආකල්පවල පවත්නා අඩු පාඩුකම්ද දුප්පත්කමට බලපානු ලැබේ. බොහෝවිට මෙය වන්නේ සමාජයෙන් හා පාසැල්වලින් අධ්‍යාපනය ලබාගැනීමේදී පවත්නා අඩුපාඩුකම් නිසාය. තවත් සමහරවිට සමාජයීය සාධකද දිළිඳුකමට ප්‍රබල හේතුවක් ලෙස පෙනේ. විශේෂයෙන්ම තනිවීම නිසා දුප්පතුන්ගේ ශක්තිය දුර්වලවේ. පවුල තුළත්, පවුල් අතරත්, පවුල හා සමාජයීය සංවිධාන අතරත් පවත්නා සම්බන්ධතා දුර්වලවීම නිසා මෙම තනිවීම ඇතිවේ. මේ නිසා විශේෂයෙන්ම මනුෂ්‍යයාට තනි තනියෙන් කළ නොහැකි කටයුතු සාමුහිකව කිරීමට තිබෙන හැකියාව ප්‍රයෝජනයට ගැනීමට නොහැකිවේ. සමෘද්ධි වැඩසටහන තුල කුඩා කණ්ඩායම් හා සමෘද්ධි සමිති ආදී ලෙස සංවිධාන ගොඩනැගීමට මුලික හේතුවක් වන්නේද මෙම තනිකම නැතිකර සාමුහික සංවිධාන ශක්තිය ගොඩනැගීම සඳහාය. දිළිඳුභාවයට තවත් ප්‍රබල හේතුවක් වන්නේ කායික, මානසික, සෞඛ්‍ය තත්ත්වය දුර්වලවීමය. විශේෂයෙන් සමහර දුප්පත් පවුල් එම තත්ත්වයෙන් ගොඩ ඒමට නොහැකි වන්නේ මෙම කායික හා මානසික සෞඛ්‍ය තත්ත්වයේ පවත්නා දුබලතාවන්ය. මේ අනුව පෙනී යන්නේ දිළිඳුභාවය හා බැඳි විවිධ බහුවිධ හේතුන් ඇති බවය. එමෙන්ම භූගෝලීය වශයෙන් එක් එක් ප්‍රදේශවල පවත්නා පාරිසරික තත්ත්වයන්ද දිළිඳුභාවයට බලපානු ලැබේ. උදාහරණයක් ලෙස අතිශයින් ශුෂ්ක කැලෑබද ප්‍රදේශයක ජීවත්වෙන පවුලකට තම ජීවත්වීම සඳහා පරිසරය සමඟ කිරීමට තිබෙන අරගලය දියුණු සමාජ හා ආර්ථික පරිසරයක ජීවත්වන පවුලකට වඩා අතිශයින් බැරෑරුම්ය. එමෙන්ම යුද්ධ හා සිවිල්

කලබල සහිත පරිසරයක ජීවත්වන පවුල්වලටද අනපේක්ෂිත දුප්පත්භාවයකට පත්වීමට සිදුවන අවස්ථා ඇත. ලංකාවේම වුවත් ඇතැම් අනාථ කඳවුරුවල ජීවත්වෙන පවුල් එම දිළිඳු තත්ත්වයට පත්වී ඇත්තේ උතුරු නැගෙනහිර පවත්නා යුද්ධමය තත්ත්වය නිසාය.

ඉහත දක්වන ලද කරුණු අනුව දුප්පත්කමට බහුවිධ හේතූන් තිබෙන බව ඉතාමත් පැහැදිලිය. මේ නිසා සමෘද්ධි මහ සංගමයට මෙම බහුවිධ හේතූන් ගැන සැලකිල්ල යොමු කරමින් විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වගකීමක් පැවරේ. සමෘද්ධි බැංකු සංගමය නැඹුරුවී ඇත්තේ වඩාත් ආර්ථික සංවර්ධනය කෙරෙහිය. සමෘද්ධි සමිතිය හා කුඩා කණ්ඩායම තුල ආර්ථික කරුණුවලට සීමා නොවී අනෙකුත් සංවර්ධන අවශ්‍යතාවන් වෙතද නැඹුරුවී ඇත. එහෙත් එම සංවිධාන දෙක නිසි පරිදි බහුවිධ සංවර්ධන කාර්යයන් සඳහා මෙහෙයවිය හැක්කේ සමෘද්ධි මහ සංගමයටය.

විශේෂයෙන් ලංකාවේ දිළිඳු ජනතාව දෙස බැලීමේදී සමාජ සංවර්ධන පැත්තේ පවත්නා අඩුපාඩුකම්වලට පිළියම් යෙදීමට මහ සංගමයට ඉඩකඩ ඇත. ලංකාව කලාපීය අන්‍ය රටවල් හා සසඳනවිට අධ්‍යාපනය හා සෞඛ්‍ය පැත්තෙන් ඉදිරියට ගොස් ඇත. සාක්ෂරතා හැකියාව 89% ක් පමණ වන අතර, ලංකාවේ මාතෘ හා ළදරු මරණ ප්‍රමාණය ඉතාමත් අඩු වී ඇත. එහෙත් පාසැල් නොයන්නන් හා අතරමඟ පාසැල් හැරයන්නන් අතර බහුතරය දුප්පත් පවුල්වලට අයත්ය. එමෙන්ම ලංකාවේ ළදරුවන්ගේ මන්ද පෝෂණ තත්ත්වය ඉතා ඉහළය. ළමා ජනගහනයෙන් 38% කට ආසන්න ප්‍රමාණයක් මන්ද පෝෂණයෙන් පෙළේ. එමෙන්ම ගැබිනි මාතාවන්ගෙන් 39% ක් පමණ රක්තහීනතාවයෙන් පෙළේ. මීට අමතරව වතුකරයේත්, නාගරික ප්‍රදේශවලත්, ග්‍රාමීය ප්‍රදේශවලත් මත්පැන්, දුම්පානය විශාල වශයෙන් පැතිර යමින් පවතී. නාගරික ප්‍රදේශවල මත්ද්‍රව්‍ය භාවිතයද වැඩි වෙමින් පවතී. මෙම සාධකයද දිළිඳු පවුල් එම තත්ත්වයෙන් මුදවා ගැනීමට බාධාවක් වී ඇත.

ඉහත තොරතුරු අනුව පහත සඳහන් සංවර්ධන කටයුතු කෙරෙහි සමෘද්ධි මහ සංගමයට විශේෂයෙන් මැදිහත්වීමේ අවශ්‍යතාවක් මතු වී ඇත.

1. පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
2. පාසැල් යායුතු, එහෙත් පාසැල් නොයන දරුවන් පාසැල්වලට යොමු කිරීම හා වැඩිහිටි සාක්ෂර පංති පැවැත්වීම, පෙර පාසැල් කටයුතු.
3. මත්පැන් හා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
4. අන්ත දුප්පතුන් සඳහා ශුභ සාධක කටයුතු කිරීම (මන්දබුද්ධික/ ආබාධිත/ අනාථ පිරිස්)
5. අසරණ වයස්ගත පිරිස් වෙනුවෙන් සුභ සාධන කටයුතු
6. දුප්පත් පවුල්වලට අවශ්‍ය පසුතල පහසුකම් සංවර්ධනය.
7. පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
8. සියදිවි නසාගැනීම් අවම කිරීම සඳහා උපදේශක සේවා ක්‍රියාත්මක කිරීම.
9. අලෙවි සංවර්ධන කටයුතු කිරීම.
10. ගෙවතු හා පශු සම්පත් සංවර්ධන කටයුතු.

ඉහත දක්වන ලද වැඩසටහන් 10 ට අමතරව ඒ ඒ ප්‍රදේශවල විශේෂ වූ හා දුප්පත් පවුල්වලට අතිශයින් බලපාන කරුණු තිබීමට පුලුවන. එවිට එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා මහ සංගමයට මැදිහත් විය හැක. සමෘද්ධි මහ සංගමයට මෙම වැඩසටහන් සඳහා බාහිර ආධාර මුදල් ලබාගැනීමට සිදුවේ. එමෙන්ම සමෘද්ධි බැංකු, සමිති හා කුඩා කණ්ඩායම් යන සංවිධාන ජාලය හරහා මෙම වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට ඉඩකඩ තිබේ. එමෙන්ම සමහර වැඩසටහන්වලට සහාය සේවා පද්ධතියේ ශක්තීන්ද යොදාගැනීමට මහ සංගමයට ක්‍රියා කිරීමට පුලුවන. ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය ඉහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය සහාය හා උපදේශක කටයුතු කිරීමට ද බලාපොරොත්තු වේ.

හම්බන්තොට කාන්තා සංවර්ධන මහ සංගමය විසින් විශේෂ පෝෂණ කාර්යාල 5 ක් පවත්වාගෙන යනු ලැබේ. තවද වැව්, අමුණු හා පාරවල් වැඩි දියුණු කිරීම් වැනි පසුතල පහසුකම් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. එමෙන්ම වැඩිහිටි සරණ, මත්පැන් හා මත්ද්‍රව්‍ය නිවාරණය, පරිසර සංරක්ෂණය, ගෙවතු සංවර්ධනය යනුවෙන් සුවිශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබේ. පාගමන් පුස්තකාල වැඩසටහනක් ද ක්‍රියාත්මක කරයි. මෙම උත්සාහයන් තුලින් පැහැදිලි වන්නේ මහ සංගමයක් මඟින්

බහුවිධ සංවර්ධනය සඳහා ගන්නා උත්සාහයකි. මෙම ආදර්ශය සමෘද්ධි මහ සංගම්වලට ගලපා ගැනිමට බොහෝ ඉඩකඩ ඇත. දුප්පත්කමට විවිධ හේතූන් බලපවත්වන නිසා සමෘද්ධි මහ සංගමයට විශේෂ අවදානයක් බහුවිධ සංවර්ධන ප්‍රවේශය පිළිබඳ කිරීමට සිදුවේ.

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ සමාජ සංවර්ධන, කෘෂි කර්ම, සත්ත්ව පාලන හා අලෙවි ආදී කටයුතු සඳහා විශේෂ අධ්‍යක්‍ෂවරුන් පත් කර ඇත. මෙම අධ්‍යක්‍ෂවරුන්ට ඒ ඒ අංශ පිළිබඳව සමෘද්ධි මහ සංගම්වලට උපදේශක කටයුතු හා වෙනත් අවශ්‍ය ව්‍යාපෘති ආධාර ලබාදීමට ඉඩකඩ ඇත. විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල අලෙවි කටයුතු පිළිබඳව සොයා බලමින් රටේ වෙනත් ප්‍රදේශවල සමෘද්ධි මහ සංගම් හා සම්බන්ධතා ගොඩනගමින් එම අංශය දියුණු කිරීමට විශාල ඉඩකඩත් ඇත. විශේෂයෙන්ම වෙළඳපොල අවශ්‍යතාවලට නිෂ්පාදන කටයුතු යොමු කිරීම සඳහා සමෘද්ධි බැංකු සංගම් මෙහෙයවීමට මහ සංගමයට ඉඩකඩ ඇත. ඉදිරියේදී වෙළඳපොල අවශ්‍යතා හඳුනා ගනිමින් ඒ සඳහා බැංකු සංගම්වල ණය ක්‍රියාවලිය යොමු කිරීමට මහ සංගමයට හැක. වෙළඳ පොලේ හොඳ මිලක් හා වැඩි ඉල්ලුමක් ඇති නිෂ්පාදන ද්‍රව්‍යවලට පහසු ණය ක්‍රම ක්‍රියාත්මක කිරීමට ඉඩකඩ ඇත. උදාහරණයක් ලෙස එළුමස් සඳහා වැඩි මිලක් හා ඉල්ලුමක් ඇත. අලෙවි ප්‍රශ්නයක් නොමැත. එහෙයින් වියළි කලාපිය හා කඳුකර ග්‍රාමීය ප්‍රදේශවල වඩ වඩාත් එළුවන් ඇති කරන අයට හොඳ වර්ගයේ සතුන් හඳුන්වා දෙමින් විශේෂ ණය ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම දැක්විය හැක. මේ අන්දමට මහ සංගමයට අලෙවිකරණ කටයුතු වලදී වඩාත් සම්බන්ධවීමට ඉඩකඩ ඇත.

ඉහත විස්තර අනුව සමෘද්ධි මහ සංගමයට දුප්පත්කමට බලපාන විවිධ හේතූන් ගැන විමර්ශනය කරමින් ඒ ඒ හේතූන්වලට පිළියම් කිරීම සඳහා ව්‍යාපෘති ආරම්භ කිරීමට විශාල ඉඩකඩක් සැලසි ඇති බව පෙනේ.

එමෙන්ම සමෘද්ධි බැංකු සංගම්, ගම්මාන මට්ටමේ සමිති හා කුඩා කණ්ඩායම් යන සංවිධාන ජාලය මහ සංගමයට මෙහිදී ඉතා මැනවින් යොදාගත හැක. දුප්පත් පවුල වෙත මහා සංවිධානයකට මෙතරම් පහළ දුප්පත් පවුල වෙත ගමන් කිරීමට හැකි සංවිධාන රටාවක් ඇති වෙනත් ආයතනයක් ශ්‍රී ලංකාවේ සොයා ගැනිම දුෂ්කරයැයි සිතමි.

## සමාප්තිය

ඉහත විස්තර අනුව දුප්පතුන් බලගන්වන සංවිධාන හා ආයතනික පද්ධතියේ මහ සංගම් උප පද්ධතිය අනෙකුත් උප පද්ධතිවල මුදුන් මට්ටමේ ආයතනය බව පැහැදිලිවේ. එමෙන්ම එය එක පැත්තකින් සමෘද්ධි බැංකු සංගම්වල මහ බැංකුව වශයෙන්ද ක්‍රියා කරනු ලැබේ. ඊට අමතරව දුප්පත්කමට හේතුවන විවිධ අංශයන් සොයා බලමින් පිළියම් කරන සර්වාංග වෛද්‍යවරයෙක් වශයෙන්ද හැඳින්වීමට පුලුවන. ඊට හේතුව මහ සංගමයේ සංවර්ධන ප්‍රවේශය බහුවිධ ලක්‍ෂණ ගැනීමයි. මෙම බහුවිධ ලක්‍ෂණය කුඩා පරිමාණයෙන් සමෘද්ධි සමිතියේ හා කුඩා කණ්ඩායම තුලත් ඇත. නමුත් බැංකු සංගමය වඩාත් නැඹුරු කර ඇත්තේ ආර්ථික වර්ධනය පැත්තටය.

මහ සංගමය කුඩා ගම්මාන මට්ටමේ සමෘද්ධි සමිතිවල සභාපතිවරුන්ගෙන් තෝරාගන්නා විධායක කමිටුවකින් පාලනය වන නිසා එය 100% ක්ම ප්‍රජාතන්ත්‍රවාදී මුහුණුවරක් ගනී. ප්‍රජා සහභාගිත්වය පැත්තෙන් බලනවිට සමෘද්ධි බැංකු සංගම් ව්‍යාපාරයේ මුල, මැද හා අග යන සෑම තැනකම තිරණ ගැනීමේ බලය සාමාජිකත්වයට පවරා ඇත. වෙනත් වචන වලින් කියන්නේ නම් බලයක් නොමැති දුප්පතුන්ට බලයක් ලබාදී ඇත. එසේම හඬක් නැති ජන කණ්ඩයකට සංවිධාන ශක්තිය තුලින් හඬක් ලබාදී ඇත. මේ අනුව බලනවිට සමෘද්ධි මහ සංගමය දුප්පතුන් බල ශක්ති ගන්වන ක්‍රියාවලියේ ඉහළම තලයේ නව ආරක ආයතනයක් ලෙස ඉදිරි කාලයේ ක්‍රියාකරනු ඇත.

SA-MAHA.DOC

ඇමුණුම - 1


සමෘද්ධි මහ සංගමයේ කාර්ය භාරය
කළමනාකරණ කටයුතු
සම්බන්ධීකරණය
අධීක්ෂණය
පාලනය
මානව සම්පත් සංවර්ධනය
ප්‍රතිලාභී පුහුණුව
කාර්ය මණ්ඩල පුහුණුව
සමාජ සජීවීකරණය
ණය අරමුදල් සම්පාදනය
බැංකු සංගම් සංරක්ෂණය
අතරැඳි මුදල් හා ප්‍රවාහනය කරන මුදල් සංරක්ෂණය
ණය සංරක්ෂණය
සමූහ සංරක්ෂණය
බොල් ණය කපාහැරීමේ සංචිතය
කොටස් හා ඉතුරුම් ආයෝජනය
බාහිර අරමුදල් ආයෝජනය
බහුවිධ සංවර්ධන ප්‍රවේශය
පෝෂණය
සාක්ෂරතා පංති
මත්පැන් හා මත්ද්‍රව්‍ය නිවාරණ
අන්ත දුප්පතුන් සඳහා සුභ සාධනය
පසුතල පහසුකම්
වැඩිහිටි සරණ
පරිසර සංරක්ෂණය
උපදේශක සේවා
අලෙවි සංවර්ධනය
ගෙවතු සහ පශු සම්පත් සංවර්ධනය

## මහා සංගමයේ සංවිධාන ව්‍යුහය




| බැංකු සංගම් ගණන | < 5 | 6 - 8 | 9 < |
|---|---|---|---|
| 1 සහකාර කළමණාකරු / මුඛ්‍ය කළමණාකරු | 1 | 1 | 1 |
| 2 මුදල් / ගිණුම් | 1 | 2 | 3 |
| 3 ආයතන | 1 | 1 | 1 |
| 4 විමර්ශන | 1 | 2 | 3 |
| 5 පුහුණු / ප්‍රකාශන | 1 | 1 | 1 |
| | 5 | 7 | 9 |

# <u>සමෘද්ධි මහ සංගම් කාර්ය මණ්ඩල රාජකාරි ලැයිස්තුව</u>

**කළමනාකාර අධ්‍යක්ෂ**

1. මහ සංගමයට අදාල රාජකාරි
සම්මේලන පැවැත්වීම
විධායක කමිටු රැස්වීම් පැවැත්වීම හා එම තීරණ
ක්‍රියාත්මක කිරීම
මහ සංගම් කාර්යාල කටයුතු කළමණාකරනය කිරීම
බැංකු සංගම් අධීක්ෂණය - සම්බන්ධීකරණය
සහය සේවා පද්ධතියට අදාල සම්බන්ධීකරණ කටයුතු
අනෙකුත් සම්බන්ධීකරණ කටයුතු

**සහකාර කළමනාකාර/ මූල්‍ය කළමනාකාර**

1. කළමනාකාර අධ්‍යක්ෂවරයාට සහායවීම
2. මුදල් හා ගිණුම් අංශයේ සියලු කටයුතු
කළමනාකරණය කිරීම
3. බහුවිධ සංවර්ධන කටයුතු

**මුදල් / ගිණුම්**

1. මුදල් පොත් / ලෙජර් පවත්වා ගැනීම
2. බැංකු ගිණුම් පවත්වාගෙන යාම
3. ණය අරමුදල් පාලනය
4. සියලුම සංරක්ෂණ කටයුතු
5. සියලුම ආයෝජන කටයුතු

**ආයතන**

1. ගොඩනැගිලි / උපකරණ
2. ලිපි/ ද්‍රව්‍ය හා තොග පාලනය
3. කාර්ය මණ්ඩල ආයතන හා විනය කටයුතු
4. ප්‍රවාහන කටයුතු

**විමර්ශණ**

1. බැංකු සංගම් විමර්ශණය
2. බැංකු සංගම් විගණනය
3. බැංකු සංගම් අධීක්ෂණය
4. ප්‍රගති පාලන හා සමාලෝචන කටයුතු

**මානව සම්පත් සංවර්ධන**

1. කාර්ය මණ්ඩල පුහුණු
2. ප්‍රතිලාභී පුහුණුව
3. සජීවීකරණ කටයුතු